# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2126/41 – 2019 ජුනි 06 වැනි බ්‍රහස්පතින්දා – 2019.06.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත 1 ඡේදයේ විස්තර කරනු ලබන පරවශ්‍යතාවය, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය ගයන්ත කරුණාතිලක වන මම මෙයින් ප්‍රකාශ කරමි. එකී පරවශ්‍යතාවය අත්කර ගනු ලබන්නේ කවර ඉඩමකින්ද යන්න 2 ඡේදයේ විස්තර වේ.

1. **පරවශ්‍යතාවේ විස්තරය.**– කුණ්ඩසාලේ - හාරගම ජල සම්පාදන ව්‍යාපෘතියේ තැන්නේකුඹුර සේවා ජලාශයේ ප්‍රවේශ මාර්ගය සඳහා පරවශ්‍යතාවය අත්කර ගැනීම.

2. **ඉඩමේ විස්තරය.**– මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මහනුවර කඩවත්සතර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මහනුවර කඩවත්සතර සහ ගඟවට කෝරළේ සුළු කොට්ඨාසයේ, අම්පිටිය උඩගම උතුර 269 සහ තැන්නේකුඹුර 275 ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, සෙමනේරිය වත්ත සහ තැන්නේකුඹුර ගම්වල පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක Maha/MHN/2017/262 හා 2017.09.14 දිනැති ප්‍රගමන අනුරේඛනයේ පහත සඳහන් නම්වලින් සහ ප්‍රමාණවලින් යුත් ඉඩම් කොටස්වලට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – සෙමනේරිය වත්ත – ප්‍රමාණය: හෙක්. 0.0116 ක් පමණ**

උතුරට: මාර්ගය (ප්‍රාදේශීය සභා) සහ ඩී. එම්. ජයතිලක හිමිකම් කියන සෙමනේරිය වත්ත; නැගෙනහිරට: ඩී. එම්. ජයතිලක හිමිකම් කියන සෙමනේරිය වත්ත, ක්‍රෙඩිට්ලයින් ෆයිනෑන්ෂල් සර්විසස් ප්‍රයිවට් ලිමිටඩ් හිමිකම් කියන තැන්නේකුඹුර වත්ත සහ කැබලි අක්ෂර බී; දකුණට: ඒ. එම්. විජිත බණ්ඩාර හිමිකම් කියන සෙමනේරිය වත්ත; බටහිරට: ඒ. එම්. විජිත බණ්ඩාර හිමිකම් කියන සෙමනේරිය වත්ත සහ මාර්ගය (ප්‍රාදේශීය සභා).

02. **කැබලි අක්ෂර 'බී' – තැන්නේකුඹුර වත්ත – ප්‍රමාණය: හෙක්. 0.0192 ක් පමණ**

උතුරට: කැබලි අක්ෂර ඒ, ඩී. එම්. ජයතිලක හිමිකම් කියන සෙමනේරිය වත්ත සහ ක්‍රෙඩිට්ලයින් ෆයිනෑන්ෂල් සර්විසස් ප්‍රයිවට් ලිමිටඩ් හිමිකම් කියන තැන්නේකුඹුර වත්ත; නැගෙනහිරට සහ දකුණට: ක්‍රෙඩිට්ලයින් ෆයිනෑන්ෂල් සර්විසස් ප්‍රයිවට් ලිමිටඩ් හිමිකම් කියන තැන්නේකුඹුර වත්ත; බටහිරට: ක්‍රෙඩිට්ලයින් ෆයිනෑන්ෂල් සර්විසස් ප්‍රයිවට් ලිමිටඩ් හිමිකම් කියන තැන්නේකුඹුර වත්ත සහ ඒ. එම්. විජිත බණ්ඩාර හිමිකම් කියන සෙමනේරිය වත්ත.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

මගේ අංකය: 4/3/9/2016/WS/555.
2019 මැයි මස 09 වැනි දින.
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
"මිහිකත මැදුර", රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

06 – 592


1A – G 30243 – 18 (2019/06) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*